# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2116/49 - 2019 මාර්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 15/2014(II)

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 44 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 57 වන වගන්තිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සාදනු ලබන රීති

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,
*(සඳහා සහ වෙනුවෙන්),*
සභාපති.

2019 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මේ රීති 2019 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලියාපදිංචි කිරීම) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණයක සහ උපකරණයක අයිතිකරුවකු විසින් එකී බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණය සහ උපකරණය (මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇත්නම් මිස එකී බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණය සහ උපකරණය භාවිත නොකළ යුතු ය.

3. (1) 2 වන රීතිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සමග අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකෘතියකින් අධිකාරියේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) 3 වන රීතියේ (1) වන අනු රීතිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම පහත දැක්වෙන ලේඛන සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :-

(අ) මාර්ගයේ ධාවනය සඳහා වූ යන්ත්‍රෝපකරණ සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය සහ වලංගු ආදායම් බලපත්‍රයේ පිටපතක් ;


1A - PG 4458 — 517 (2019/03)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) යන්ත්‍රෝපකරණයේ හෝ උපකරණයේ හිමිකාරත්වය නිශ්චිතව දක්වෙන අයිතිකරුගෙන් ලබා ගත් දිවුරුම් ප්‍රකාශයක් සහ හිමිකාරත්වය ඔප්පු කිරීම සඳහා වෙනත් ලේඛන ; සහ

(ඇ) ඉල්ලීම ඉදිරිපත් කළ දින සිට මාස හයක කාලසීමාවක් ඇතුළත, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියක් ලබා ගත් යාන්ත්‍රික ඉංජිනේරුවරයකු විසින් යන්ත්‍රෝපකරණ සහ උපකරණය සේවයට යෙදවීමේ යෝග්‍යතාවය සම්බන්ධයෙන් නිකුත් කරන ලද තත්ත්ව වාර්තාවක්.

(3) මේ රීතිය යටතේ කරනු ලබන ඉල්ලීමක, බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණය සහ උපකරණය පිළිබඳ විස්තර ඇතුළත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින්, අවශ්‍ය වන අවස්ථාවක දී, වැඩිදුර තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම්කරුට නියම කළ හැකි ය.

4. 3 වන රීතිය යටතේ ඉල්ලීමක් ලැබුණු පසු, අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින්, ඉල්ලීමේ සහ ලේඛනවල ඇතුළත් කරුණු පිළිබඳව සලකා බැලීමෙන් පසු, එකී යන්ත්‍රෝපකරණය හෝ උපකරණය ලියාපදිංචි කර, ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම හෝ එකී යන්ත්‍රෝපකරණය හෝ උපකරණය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කර, එකී ප්‍රතික්ෂේප කිරීමට හේතු සටහන් කළ යුතු ය. අධ්‍යක්ෂ - ජනාරාල්වරයා විසින් ඔහුගේ තීරණය පිළිබඳ ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතු අතර, එකී යන්ත්‍රෝපකරණය හෝ උපකරණය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක දී ඔහු විසින් ඊට හේතු සඳහන් කළ යුතු ය.

5. සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක්ම අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකෘතියක විය යුතු අතර එකී ලියාපදිංචි කිරීමේ සහතිකය, කලින් ප්‍රත්‍යාදිෂ්ට කළහොත් මිස, එහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර, එහි නිශ්චිතව දක්වා ඇති යම් නියමයන්ට සහ කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

6. අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින්, ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් යන්ත්‍රෝපකරණයක හෝ උපකරණයක අයිතිකරුවකු වෙත ද, එකී අයිතිකරු විසින් 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති හෝ එකී ලියාපදිංචි කිරීමේ සහතිකයේ යම් නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කර ඇති බවට ඔහු සෑහීමට පත්වුවහොත්, 4 වන රීතිය යටතේ නිකුත් කළ ලියාපදිංචි කිරීමේ සහතිකය ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

7. (1) 4 වන රීතිය යටතේ නිකුත් කළ ලියාපදිංචි කිරීමේ සහතිකයක්, එකී ලියාපදිංචි කිරීමේ සහතිකයේ වලංගු කාලය ඉකුත්වීමට දින තිහකට නොඅඩු කාලසීමාවකට පෙර මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද සමග තත් කාර්යය සඳහා අධ්‍යක්ෂ - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ඉල්ලීමක් මත අලුත් කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් යන්ත්‍රෝපකරණයක හෝ උපකරණයක අයිතිකරුට ද, එකී අයිතිකරු 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග හෝ රීති හෝ එකී ලියාපදිංචි කිරීමේ සහතිකයේ යම් නියමයන් සහ කොන්දේසි පිළිපැද ඇති බවට අධ්‍යක්ෂ - ජනරාල්වරයා සෑහීමට පත්වුවහොත් පමණක් ඔහු විසින් එකී ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කළ යුතු ය.

8. අධ්‍යක්ෂ - ජනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් සෑම තැනැත්තකුම විසින්, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 53 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවන ලද අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

9. අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් -

(අ) මේ රීති යටතේ අධිකාරියේ ලියාපදිංචි කරන ලද සෑම බර ඉදිකිරීමේ යන්ත්‍රෝපකරණයක්ම සහ උපකරණයක්ම මෙහි තුන්වන උපලේඛනයේ දක්වා ඇති ආකාරයෙන් ඇතුළත් කළ යුතු රෙජිස්ටරයක් පවත්වාගෙන යාමට ; සහ

(ආ) එය නිතිපතා යාවත්කාලීන කිරීමට සහ ඊට මහජනතාවට ප්‍රවේශ විය හැකි ලෙසට

කටයුතු සැලැස්විය යුතු ය.

පළමුවන උපලේඛනය

*බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ ඒවායේ කෙටියෙදුම්*

(2 වන රීතිය)

| *අංකය* | *බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ* | *කෙටියෙදුම* |
|---|---|---|
| 1. | වීල් ලෝඩර් | WL |
| 2. | බිටුමන් බවුසර් | BB |
| 3. | ඇස්ෆෝල්ට් පේවර් (ක්‍රෝලර් මාදිලිය) | ASP-Cr |
| 4. | ඇස්ෆෝල්ට් පේවර් (වීල් මාදිලිය) | ASP-W*l* |
| 5. | නියුමටික් ටයර් රෝලර් | PTR |
| 6. | ස්ටැටික් රෝලර් | SR |
| 7. | වයිබ්‍රේටින් රෝලර් ඩබල් ඩ්‍රම්/සින්ගල් ඩ්‍රම් | VR |
| 8. | ක්‍රෝලර් ට්‍රැක්ටර්/ක්‍රෝලර් ඩෝසර් | CT |
| 9. | බැකෝලෝඩර් | BL |
| 10. | හයිඩ්‍රොලික් එක්ස්කැවේටර් | EX |
| 11. | මෝටර් ග්‍රේඩර් | MG |
| 12. | ස්කිඩ් ස්ටියර් ලෝඩර් | SSL |
| 13. | බූම් ට්‍රක් | BT |
| 14. | ෆෝක් ලිෆ්ට් | FLT |
| 15. | මොබයිල් ක්‍රේන් | MCRN |
| 16. | ටවර් ක්‍රේන් | TCRN |
| 17. | ක්‍රෝලර් ක්‍රේන් | CCRN |
| 18. | පයිලින් මැෂින් | PLM |
| 19. | ඇස්ෆෝල්ට් මික්සින් ප්ලාන්ට් | ASPMP |
| 20. | ක්‍රෂින් ඇන්ඩ් ස්ක්‍රීනින් ප්ලාන්ට් | CRSH |
| 21. | ඩ්‍රම්ඩ් ඇස්ෆෝල්ට් මෙල්ටර් | DAM |
| 22. | කොන්ක්‍රීට් බැචින් ප්ලාන්ට් | CBP |
| 23. | සෑන්ඩ් වොෂින් ප්ලාන්ට් | SWP |

## දෙවන උපලේඛනය

### *බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු සහ අලුත් කිරීමේ ගාස්තු*

(3(1) සහ 7 (1) වන රීති)

| *විස්තරය* | *ලියාපදිංචි කිරීමේ ගාස්තු හෝ වාර්ෂික අලුත් කිරීමේ ගාස්තු* |
|---|---|
| ප්‍රථම යන්ත්‍රෝපකරණ 25 දක්වා | එක් එක් යන්ත්‍රය සඳහා රු. 1000/- |
| 26 වන යන්ත්‍රයේ සිට 50 වන යන්ත්‍රය දක්වා | එක් එක් යන්ත්‍රය සඳහා රු. 750/- |
| 51 වන යන්ත්‍රයේ සිට 75 වන යන්ත්‍රය දක්වා | එක් එක් යන්ත්‍රය සඳහා රු. 500/- |
| 76 වන යන්ත්‍රයේ සිට 100 වන යන්ත්‍රය දක්වා | එක් එක් යන්ත්‍රය සඳහා රු. 300/- |
| 101 වන යන්ත්‍රයේ සිට ඉහළට | එක් එක් යන්ත්‍රය සඳහා රු. 100/- |

ඉහත ගාස්තු බදු එකතු නොකළ අගයන් වේ.

## තුන්වන උපලේඛනය

### *බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ රෙජිස්ටරය*

(9 (අ) වන රීතිය)

| *අංකය* | *බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණයේ හෝ උපකරණයේ අයිතිකරුවන්ගේ නම, ලිපිනය සහ සම්බන්ධකර ගත හැකි ආකාරය.* | *බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණයේ හෝ උපකරණයේ වර්ගය.* | *බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණයේ හෝ උපකරණයේ නිෂ්පාදනය සහ මාදිලිය.* | *බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණයේ හෝ උපකරණයේ ආරම්භක රට.* | *බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණය හෝ උපකරණය තබා ඇති ස්ථානය හෝ ස්ථිරව නවතා ඇති ස්ථානයේ ලිපිනය.* | *පළමු ලියාපදිංචි කිරීමේ දිනය සහ වත්මන් ලියාපදිංචියේ කාලසීමාව.* | *ලියාපදිංචි කිරීමේ අංකය.* |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

04 - 414